# අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களை புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு

**COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION**

තැ.පෙ. 1431, 36, මලලසේකර මාවත, කොළඹ 07. த.பெ. 1431, 36, மலலசேகர மாவத்தை, கொழும்பு 07. P.O. Box 1431, 36, Malalasekara Mawatha, Colombo 07.

දුරකථන අංක/தொலைபேசி/Telephone: +94 112596365, +94 112596360 ක්ෂණික ඇමතුම් අංකය/Hotline: 1954 ෆැක්ස්/மின்னஞ்சல்/Fax: +94 112595045

වෙබ් අඩවිය/இணையத்தளம்/website: www.ciaboc.gov.lk විද්‍යුත් තැපෑල/மின்னஞ்சல்/E-mail : ciaboc_gen@ciaboc.gov.lk


2026.03.04 මාධ්‍ය නිවේදන අංක 2026/024

ප්‍රධාන කර්තෘ/ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ
සියලු මාධ්‍ය ආයතන

**රුපියල් 20,000,000/- (රුපියල් මිලියන විස්ස) ක මුදලක් අල්ලස් ලෙස ඉල්ලා ලබාගැනීමේ චෝදනාව මත සෞඛ්‍ය අමාත්‍යංශයේ විශ්‍රාමික ප්‍රධාන ලිපිකරුවෙකු අත්අඩංගුවට**

2018 වර්ෂයේ දී සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යංශය වෙත පුද්ගලික ආයතනයකින් ගොඩනැගිල්ලක් කුලී පදනම මත ලබාගැනීමෙන් පසු ඒ සඳහා සෞඛ්‍ය අමාත්‍යංශයෙන් චෙක්පත් මඟින් කුලී මුදල් ගෙවීමේ දී අදාළ චෙක්පත් ප්‍රමාදයකින් තොරව ලබා දීමට පොරොන්දු වී ඒ වෙනුවෙන් අල්ලස් මුදල් ඉල්ලා අවස්ථා 07 ක දී චෙක්පත් මඟින් රුපියල් මිලියන 20 ක අල්ලස් මුදලක් ඉල්ලා, ලබාගැනීමට කටයුතු කිරීමේ චෝදනාව මත සෞඛ්‍ය අමාත්‍යංශයේ විශ්‍රාමික ප්‍රධාන ලිපිකරුවෙකු 2026.03.04 වන දින ප.ව.1.15 ට පමණ සෞඛ්‍ය අමාත්‍යංශයේ ආපන ශාලාවේ දී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් විසින් අත්අඩංගුවට ගන්නා ලදි.

අත්අඩංගුවට ගත් සැකකරු කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2026 මාර්තු මස 17 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාරගත කරන ලදි

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ මාධ්‍ය ඒකකය
0112502672